**කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව**

**දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය**

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි ප්‍රථම පරීක්ෂණය (බාහිර) - 2019

2023 ජුනි

**සමාජීය විද්‍යා පීඨය**

**සංවර්ධන අධ්‍යයනය**

**සමකාලීන සංවර්ධන ප්‍රවණතා - DVST 18224**

ප්‍රශ්න පහකට (05) පමණක් පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි.** **කාලය : පැය 03 යි.**

---

01. ලෝකයේ රටවල් අතර සංවර්ධන අසමානතා බිහිකරන නූතන ක්‍රියාවලිය පැහැදිලි කරන්න. (ලකුණු 20)

02. සංවර්ධනයේ අසමානතා පදනම් කරගනිමින් ලෝකයේ රටවල් කලාපීයකරණයකොට ඇති ආකාරය පෙන්වා දෙන්න. (ලකුණු 20)

03. රටවල් අතර පුළුල්වන සංවර්ධන පරතරය අවම කිරීමට ක්‍රියාත්මක කරමින් තිබෙන වැඩසටහන් 04ක් පැහැදිලි කරන්න. (ලකුණු 20)

04. තවමත් නොවිසඳුන ගෝලීය දිළිඳුබව තුරන් කිරීමේ අභියෝගයේ වර්තමාන ස්වභාවය විමසන්න. (ලකුණු 20)

05. ස්වභාවික පරිසරයේ බිඳවැටීම පාලනය කිරීමට ගෝලීය සංවිධාන ගෙන ඇති පියවරයන්හි ප්‍රවණතා පිරික්සන්න. (ලකුණු 20)

06. ලෝකයේ බලවත් රාජ්‍යයන් අතර මතුවන ගැටලු පර්යන්ත රටවලට බලපාන ආකාරය උදාහරණ 02ක් ඇසුරින් විමසන්න. (ලකුණු 20)

07. චීන මහජන සමූහාණ්ඩුවේ 'එක මාවතක් එක තීරයක්' (One road - One belt) ප්‍රතිපත්තිය දියුණුවන රටවලට සිදුකරන බලපෑම විචාර පූර්වකව ගෙනහැර දක්වන්න. (ලකුණු 20)

08. පහත දැක්වෙන මාතෘකා 02ක් විස්තර කරන්න. (ලකුණු 10x02=20)

    i. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF)
    ii. එක්සත් ජාතීන්ගේ සංවිධානය (UNO)
    iii. සංක්‍රාන්ති ආර්ථිකයන් (Transition economies)
    iv. පාරිසරික කුෂ්නෙට් වක්‍රය (Environmental kuznets curve)

**************************************